# ජන දිවියට පිටුවහලක්: පොල

**භා**ණ්ඩ මිලදී ගැනීමේ සහ අලෙවි කිරීමේ පරමාර්ථයෙන්, පාරිභෝගිකයන් සහ වෙළඳුන්, යම් නිශ්චිත ස්ථානයකට, නිශ්චිත දිනක, නිශ්චිත කාල සීමාවක් තුළ දී එක් රැස්වී ගනුදෙනු කටයුතු වල නියැලෙන ක්‍රියාවලිය ''පොල'' ලෙස හැඳින්වේ. 'පොල භූමිය' යනු ඔවුන් එසේ එක් රැස්වන ස්ථානයයි. මෙවැනි පොලවල් වලින් බොහොමයක් පැවැත්වෙන්නේ සති අන්තයේ දී ය.

'පොල' සතුව විශේෂ සම්ප්‍රදායන් රැසක් බිහි වී ඇති අතර ඒවා ග්‍රාමීය ජනතාවගේ දිවිපෙවෙත හා බැඳී පවතී. පොලක මෙම සම්ප්‍රදායික නීති රීති පද්ධතිය ආයාසයකින් තොරව ක්‍රියාත්මක වේ. පෙර රජ සමයේ පවා ඉතා ක්‍රමවත්ව හා සාරවත් ව සති පොලවල් පැවතුනු බව, 'බදුලු ටැම් ලිපිය' වැනි ඓතිහාසික සාධක වලින් හෙළි වේ. මේ අනුව වර්තමාන පොල දිගු කාලයක් තිස්සේ සිදු වූ විකාශනයක ප්‍රතිඵලයක් ලෙස හඳුන්වා දිය හැකි ය.

ගැමි ජන ජීවිතයේ එදිනෙදා අවශ්‍යතා සපුරා ලන පොල, අදාල ප්‍රදේශය තුල සිටින ගැනුම් කරුවන්ට, සහ අලෙවි කරුවන්ට පහසුවෙන් එක් රැස්විය හැකි, එසේ එක්රැස් වීමට කැමති සහ භාණ්ඩ ප්‍රවාහනයට පහසුකම් ඇති, කේන්ද්‍රීය ස්ථානයක ස්ථානගත වීමෙන් ඉක්මනින් වර්ධනය වේ. පොල පැවැත්වෙන භූමිය, ඇති පහසුකම්, එහි පරිපාලනය සහ පාරිභෝගිකයන් හා වෙළඳුන් අතර ඇති අන්තර් සබඳතාවය වැනි කරුණු පොලක පැවැත්ම සඳහා වැදගත් වේ.

වර්තමානයේ මෙරට සෑම ප්‍රධාන නගරයක් මෙන් ම කුඩා නගරයක්, ඇසුරින් ම පොල වල් බිහිවී තිබෙනු දැකිය හැකිය. ඒ අනුව 400 කට වැඩි පොලවල් ප්‍රමාණයක් දැනට දිවයිනේ ක්‍රියාත්මකව පවතී. නගරවලින් මඳක් ඈතට යත්ම ගම් කිහිපයක ජනයා තම දහසකුත් එකක් අවශ්‍යතා පිරිමසා ගනු වස් එක්රැස්වන මංසන්ධි පොලවල් බිහිවීමෙහි ලා පාදක වී ඇත.

සියයට අසූවක් පමණ වන මෙරට ග්‍රාමීය ජනතාවගෙන් බහුතරය කෘෂිකර්මය තම ජීවනෝපාය කරගත් අයයි. එසේම කාර්මික නිෂ්පාදන (කම්හල්වල නිෂ්පාදනය නොකෙරෙන කැති, පිහියා වැනි දෑ සහ අත්කම් භාණ්ඩ) කෙරෙහි නැඹුරු වී තම ජීවනෝපාය සකස් කර ගැනීමට හුරු වූ පිරිසක් ද මේ අතර සිටිති. එහෙත් වැඩි සංඛ්‍යාවක් තමාගේ නිෂ්පාදන අලෙවි කර ගැනීම සඳහා ඇදෙනුයේ පොලවල් කරා ය. එසේම මහා පරිමාණයෙන් වගා කරන ගොවීන් හැරුණු විට සුළු ගොවියන් බොහොමයක් තමාගේ නිෂ්පාදන සඳහා යහපත් මිලක් බලාපොරොත්තු වන්නේ ද පොලෙනි. එහෙයින් 'පොල' අපේ ග්‍රාමීය කෘෂි ආර්ථිකයේ 'හදවත' ලෙස හැඳින්විය හැකි ය.

ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ පර්යේෂණ හා පුහුණුකිරීමේ නිලධාරි

**බණ්ඩාර රත්නායක**

**විසිනි.**

අලෙවි ක්ෂේත්‍රයේ දී පොල දෙයාකාරයකින් වැදගත් වේ. එනම් නිෂ්පාදකයන්ට තම නිෂ්පාදන අලෙවි කළ හැකි ස්ථානයක් වශයෙන් සහ පාරිභෝගිකයන්ට තම අවශ්‍යතා සපුරා ගැනීමට හැකි ස්ථානයක් වශයෙනි. බොහෝ වෙබඳ පොලවල් මෙකී දෙයාකාරයටම කටයුතු කෙරෙන මධ්‍යස්ථානයන් වන අතර නාගරික පොලවල් බොහොමයක් පරිභෝජනය සඳහා භාණ්ඩ විකිණීම අතින් පමණක් වැදගත් වේ. මේ හැරුනුවිට ග්‍රාමීය ජනතාව බාහිර ලෝකය හා සම්බන්ධකම් පවත්වන සන්ධිස්ථානයක් වශයෙන් ද ක්‍රියාත්මක වන හෙයින් 'පොල' 'සන්නිවේදන මධ්‍යස්ථානයක්' ලෙස ද සැළකිය හැකිය. මේ පිළිබඳ ව අදහස් දක්වන ඊ ගෝමිසන් ''සංවර්ධනය වන රටවල පොලෙහි කාර්යභාරය'' නම් ග්‍රන්ථයේ මෙසේ සඳහන් කරයි. ''දුප්පත් ගැමි ජනතාවට ප්‍රයෝජනවත් වන සංවර්ධන කටයුතු වල දී මෙන් ම අලෙවිකරණයේ හා ගමනාගමනයේ දියුණුවට කැපවූ ලබන ඕනෑම අනාගත කටයුත්තකදී ප්‍රමාණවත් ජනගහණයක් ඇති වෙළඳ පොල සැළකිල්ලට ගත යුතුය. වෙළඳ පොල යනු පමණ ගැමි ජන කොටස් වලට බාහිර ලෝකය හා සම්බන්ධකම් පවත්වා ගැනීමට මුල් වන ප්‍රධාන මධ්‍යස්ථානයකි. වෙළඳ පොල මගින් කාර්යයන් දෙකක් ඉටුවිය යුතුය. එනම්, ප්‍රාදේශීය නිෂ්පාදන එක්රැස් කර තබන හා ඇසුරුම් භාණ්ඩ සාධාරණ මිලකට අලෙවිකරණ මධ්‍යස්ථානයක් වශයෙන් සහ සම්පූර්ණයෙන් සංවර්ධනය වූ කුඩා පරිමාණ මධ්‍යස්ථානය යන අර්ථයෙන් යුතු අධ්‍යාපන සෞඛ්‍ය, පරිපාලන හා අනිකුත් පරමාර්ථ සඳහා වූ මධ්‍යස්ථාන වශයෙනි.''

දිගු කාලයක් තිස්සේ ග්‍රාමීය ජනතාවගේ බොහෝ කාර්යයන් හා බැඳී පවත්නා ස්ථානයක් වශයෙන් 'පොල' ක්‍රියාත්මක වෙමින් පැවත ආ බව මෙම ප්‍රකාශනයෙන් පැහැදිලි වේ. මේ අනුව ග්‍රාමීය ජනතාවගේ ජීවන තත්ත්වය නඟා සිටුවීම සඳහා දරණ ප්‍රයත්නයේ දී පොල කෙතෙක් දුරට කේන්ද්‍රස්ථානයක ලා සැළකිය හැකි දැයි යන්න සොයා බැලීම වැදගත් ය.

කෘෂිකාර්මික භාණ්ඩ සහ කාර්මික භාණ්ඩ නිෂ්පාදනය කරන අපේ සුළු නිෂ්පාදකයින්ගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීම සඳහා කළ යුත්තේ ඔවුන්ගේ නිෂ්පාදන වලට හොඳ මිලක් ලබා දීමයි. එම නිෂ්පාදනවල මිල නියම වන්නේ පොල තුළ දී බැවින් 'හොඳ මිලක්' ලබාදීම ද සිදුවිය යුත්තේ පොලෙනි. මේ සඳහා පොල ක්‍රමය වඩාත් කාර්යක්ෂම කලයුතු අතර එය කළ හැක්කේ පොල වර්ධනය කිරීම මගිනි.

පොලෙහි වර්ධනය කළ යුත්තේ කුමන අංශයන් ද යන්න සැළකිල්ලට ගත යුතුය. එහි බාහිර පහසුකම් මෙන් ම අභ්‍යන්තර පහසුකම් ද වර්ධනය

කළ යුතුය. බාහිර පහසුකම් වර්ධනය කිරීම මගින් පොල වෙත ඇදී එන ගනුදෙනු කරුවන් ප්‍රමාණය ඉහළ නගින අතර පොලේ සිදුවන වෙළඳ කටයුතු ප්‍රමාණය ද ඉහළ යයි. එසේ ම අභ්‍යන්තර පහසුකම් වර්ධනය කිරීම තුළින් පොලට පැමිණෙන පාරිභෝගිකයන් මෙන් ම අලෙවිකරුවන්ද දිගු කාලීනව රඳවා ගැනීමට හැකිවේ.

පොලක් ආශ්‍රිතව සංවර්ධනය කළ යුතු ප්‍රධාන බාහිර පහසුකම් තුනකි. එනම්, ප්‍රවාහණ පහසුකම්, පණිවුඩ හුවමාරු පහසුකම් හා බැංකු, රෝහල්, ව්‍යාප්ති සේවා යනාදි පහසුකම්ය. මේවා වර්ධනය කිරීම තුළින් පොලට පැමිණෙන පාරිභෝගිකයන් පිරිස සහ වෙළඳුන් පිරිස වැඩි විය හැකි අතර එමගින් පොළ තුල කෙරෙන දෛනික ගනුදෙනු ප්‍රමාණයද ඉහළ නගිනු ඇත. එසේ ම හොඳ ප්‍රවාහන පහසුකම් ඇතිනම් පොලට හා ඉන් පිටතට භාණ්ඩ ප්‍රවාහනය කරන්නන්හට දැරීමට සිදුවන අධික ප්‍රවාහන වියදම් ද යම් දුරකට අඩුකර ගත හැකිය.

පොල භූමිය තුළ පැවතිය යුතු, වෙළඳ කටයුතු පහසු කරවන, සෑම පහසුකමක් ම එහි අභ්‍යන්තර පහසුකම් වේ. පොලේ ජනප්‍රියත්වය සහ වර්ධනය සඳහා මේවා බොහෝ දුරට ඉවහල් වන අතර, එවැනි පහසුකම් කීපයකි, එනම් අලෙවි මඩු, ජල පහ පහසුකම්, වැසිකිළි පහසුකම්, වාහන නැවතුම් පොලවල්, විදුලි බලය, ආපනශාලා සහ ආරක්ෂක සේවාවන්ය. මීට අමතර ව පොල පිරිසිදු කිරීමේ ක්‍රමයක් සහ වැසි ජලය බැසයන මතු පිටකානු ක්‍රමක් තිබීම වැදගත්ය. වේ. මේවායින් අළෙවි මඩු, ජලය, වැසිකිළි, සහ පොල පිරිසිදු කිරීමේ ක්‍රමය අත්‍යාවශ්‍යය පහසුකම් වන අතර මේ සියල්ල ම හෝ ඉන් විශේෂිත වූ කිහිපයක් නොමැති ව අලෙවි කටයුතු වල නිරතවීම දුෂ්කර කාර්යයක් වේ.

බොහෝ පොලවල්වල යටිතල පහසුකම් ඉතා අල්ප බව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය 1980 දී කරන ලද කුරුණෑගල ග්‍රාමීය පොල අධ්‍යයනයෙන් ද 1988 දී කරණ ලද කළුතර පොල අධ්‍යයනයෙන් ද පෙන්වා දී ඇත. පොලවල් වලින් සියයට අසූ හයකම (86%) අයිතිය ඇත්තේ රාජ්‍ය අංශයට වුවද ඔවුන් විසින් පොල පහසුකම් වර්ධනය කිරීම් සඳහා සැලකිය යුතු උත්සාහයක් ගෙන නොමැති බව ඉන් පැහැදිලිය. සෑම පොලකින් ම පොල හිමියාට යම් ආදායමක් ලැබෙන අතර එම ආදායමෙන් (පොල බදු) සැළකිය යුතු ප්‍රතිශතයක් හෝ එහි සංවර්ධනයට යොදවන්නේ නම්, 'පොල' සංවර්ධනය කිරීම අපහසු නොවේ.

පොල සංවර්ධනය කිරීම තුළින් ගැමි ආර්ථිකයෙහි යම් වෙනස්කම් කිහිපයක් සිදුවිය හැකි ය. පොලක බාහිර පහසුකම් වර්ධනය වන විට පොල හා ඒ අවට ප්‍රදේශයේ සංවර්ධයක් නිතැතින් ම සිදු වෙයි. පොලේ සිදුවන වෙළඳ කටයුතු ප්‍රමාණයේ ඉහළ යෑම නිසා වෙළඳුන් වැඩි සංඛ්‍යාවක් පොලට එකතු වේ. මෙය ප්‍රදේශයේ සුළු නිෂ්පාදන සඳහා ඉහළ මිලක් තීරණය වීමට ඉවහල් විය හැකිය.

පොලෙහි අභ්‍යන්තර පහසුකම් වර්ධනය කිරීම තුලින් විවිධ අංශවල රැකියා අවස්ථාවන් බිහිකළ හැකිය. ආපනශාලා, වාහන නැවතුම්, ආරක්ෂක සේවාවන් සහ පිරිසිදු කිරීමේ ක්‍රමයක් බිහිවීම නිසා එක් පොලක් මුල් කොට ගෙන ප්‍රදේශයේ කිහිප දෙනකුට ම රැකියා අවස්ථාවන් ඇති වේ. එසේම වෙළඳ කටයුතු කාර්යක්ෂම වීම මගින් අළුත් පිරිසකට වෙළඳ වෘත්තිය තෝරා ගැනීමේ අවස්ථාවද හැලසනු ඇත.

මේ අනුව පොල සංවර්ධනය කිරීම තුලින් ග්‍රාමීය ප්‍රදේශයන්හි උග්‍ර විරැකියාවට යම් පිළිසරණක් ලබාගත හැකි අතර, ප්‍රදේශයේ ආර්ථික සංවර්ධනය කාර්යක්ෂම කිරීමක් ද කළ හැකිය. ඉහත සඳහන් කර ඇති අයුරින් මේ සඳහා අතිරේක වියදමක් දැරීමට රජයට හෝ වෙනත් ආයතනයකට සිදු නොවීම මෙහි ඇති විශේෂත්වයයි. එසේම පොල සංවර්ධනය කිරීම තුලින් පමණක් මෙම ප්‍රතිඵලයන් නෙලා ගත නොහැකි බවද සැලකුවමනාය. ඒ සඳහා පොල පරිපාලන ආයතන සතුව ඇති පොල සම්බන්ධයෙන් ඉටුවිය යුතු වගකීම් වන, අඛණ්ඩ ව පොල පැවැත්වීම, පොලට අවශ්‍ය පහසුකම් සැපයීම සහ ඒවා නඩත්තු කිරීම මෙන් ම පොල කටයුතු පරීක්ෂා කිරීම ද නිරන්තරයෙන්, නිසියාකාරව සිදුවිය යුතුය.


**ගොවිජනතාව**

**සගරාව**

**නොමිලයේ**

**ලබා ගැනීමට**

**ඔබ කැමතිද ?**

**ඒ සඳහා ඔබේ හිතවතුන් 15 දෙනෙකු දායකයන් ලෙස බඳවා දෙන්න.**

**විස්තර විමසන්න.**

අධ්‍යක්ෂ,

**ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය.**

තැ. පෙ. 1522

114, විජේරාම මාවත,

කොළඹ 7.